**බීඕසී ට්‍රැවල්ස් ( පුද්ගලික) සමාගම - 2022**
**-----------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

බීඕසී ට්‍රැවල්ස් ( පුද්ගලික) සමාගමේ ("සමාගම") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය සිදු කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක

සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර,එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් මාගේ විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව;

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 නුසුදුසු අගය කිරීම හෝ ඇස්තමේන්තු කිරීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2022 දෙසැම්බර් 31 දිනට රු. 32,187,826 වටිනාකමැති තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල, පිරියත හා උපකරණ සමාගම සතුව ඇත. එය සමාගමේ මුළු දේපල, පිරියත හා උපකරණ වලින් සියයට 72.96 ක් නියෝජනය කරයි. කෙසේ වෙතත්, මෙම වත්කම්වල ඵලදායි ආයුකාලය නැවත තක්සේරු කරමින් මූල්‍ය ප්‍රකාශනවල පසුගාමී ගැලපීම් සිදුකර නොතිබුණි. | සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වලින් සියයට 75.45 ක් (රු.24,287,000) සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද මෝටර් වාහන පෙන්නුම් කරයි. නඩත්තු පිරිවැය අධික නිසා ප්‍රයෝජනවත් ආයුකාලයෙන් පසු සියළු මෝටර් වාහන විකුණා නැවත මිලදී ගැනීම කෝවිඩ් 19 ට පෙර සමාගමේ ප්‍රතිපත්තිය විය.නමුත් රටේ පවතින වර්තමාන ආර්ථික තත්වය හේතුවෙන් විකිණීමට හෝ නැවත මිලදී ගැනීමට හැකියාවක් නැත. අවශ්‍යතාවය ඉටුකිරීමට රටේ ආර්ථිකය සුමට වනතුරු අපි බලා සිටින්නෙමු. | මෙම වත්කම්වල ඵලදායි ආයුකාලය නැවත තක්සේරු කිරීම හෝ වර්තමාන වෙලඳපල වටිනාකම භාවිතා කරමින් වත්කම්වල වටිනාකම නැවත තක්සේරු කිරීමට නිර්දේශ කෙරේ. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

**විගණන නිරීක්ෂණ**

(අ) සමාගමේ ණය ප්‍රතිපත්තියට අනුව, රජයේ දෙපාර්තමේන්තුවලට, ආයතනික ගණුදෙනුකරුවන්ට සහ තනි ගණුදෙනුකරුවන්ට පිළිවෙලින් දින 60, දින 30 සහ දින 15 ක උපරිම ණය කාලසීමාවන් ලබා දී ඇති අතර උපරිම ණය දිගුව ලබාදෙන්නේ දින 10 කට පමණි.සෑම පාරිභෝගික කාණ්ඩයකම හිඟ ණයගැති ශේෂ විශ්ලේෂණය කිරීමේදී සමහර ශේෂ සමාගමේ ඉඩ දී ඇති ණය කාලය ඉක්මවා ගොස් ඇති බව නිරීක්ෂණය විය.එම නිසා නියමිත ණය කාලය ඇතුලත හිඟ ණයගැති ශේෂ අයකරගැනීමට සමාගමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. මුළු හිඟ ණයගැති ශේෂයන්හි කාල විශ්ලේෂණයක් පහත වගුවේ දැක්වේ.

| පාරිභෝගික කාණ්ඩය | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ (රු.000') | | | | හිඟය මුළු මුළු හිඟයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | දින 0-180 | දින 181-360 | දින 360 ට වැඩි | මුළු ගණන | |
| රජය | 55,501.6 | 136.9 | 11,476.1 | 67,114.6 | 49 |
| ආයතනික හා වෙනත් | 32.907.3 | 302.3 | 6,442.6 | 39,652.2 | 29 |
| තනි පුද්ගල | 16,321.7 | 1,569.7 | 13,119.0 | 31,010.4 | 22 |
| මුළු ගණන | 104,730.6 | 2,008.9 | 31,037.7 | 137,777.2 | 100 |

(ආ) රු.137,777,247 ක මුළු හිඟ ණයගැති ශේෂයෙන් රු. 104,730,618 හෝ සියයට 76 ක් දින 180 ක කාලසීමාවක් දක්වා සහ රු. 31,037,691 හෝ සියයට 23 දින 360 කට වඩා හිඟව පවතින අතර එය සමාගමේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා අහිතකර ලෙස බලපෑ හැක.

(ඇ) රු.137,777,247 ක මුළු හිඟ ශේෂයෙන් රු. 67,114,596 හෝ සියයට 49 ක් රජයේ ආයතන වලින් ලැබිය යුතු වේ.සමාගම විසින් රජයේ ආයතන සඳහා දින 60 ක ණය කාලසීමාවකට ඉඩ දී තිබුණද ,2022 දෙසැම්බර් 31 දිනට මුළු ලැබීම් වලින් රු.11,613,008 හෝ සියයට17.3 ක් දින 181 කට වඩා හිඟව තිබුණි.

**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**

සමාගම විසින් පිරිනමන ලද ණය කාලසීමාව තුල ණය අයකරගැනීමට ගත හැකි සියළු පියවර ගෙන තිබුණි.

නමුත් බොහෝ අවස්ථාවලදී රාජ්‍ය ආයතන හා ආයතනික ආයතන සමග පසු විපරම් කිරීමේදී තවදුරටත් ගෙවීම් ප්‍රමාද වීමට ඔවුන් හේතු දක්වයි.චාරිකා හා සංචාරක ව්‍යාපාරය අවාසනාවන්ත ලෙස ණය මත පදනම් වන වෙළඳපලක් වන අතර රාජ්‍ය ආයතන හා ආයතනික ආයතන වෙත එල්ල වන පීඩනය හමුවේ වෙනස් චාරිකා හා සංචාරක සමාගම් සමග ගණුදෙනු කිරීමේ විකල්ප අවස්ථාව ඔවුන් සතුව ඇත.

අපගේ සැපයුම්කරුවන්ට නියමිත වේලාවට පියවීම් සහතික කිරීම උදෙසා සමාගම තුලට කුඩා අරමුදල් ගලා ඒමට සමාගම තුල පවත්නා ණය ප්‍රතිපත්තියට අවනතව කටයුතු කිරීමට කාර්යමණ්ඩලය වෙත සැමවිටම උපදෙස් දෙනු ලැබේ.

**නිර්දේශය**

සමාගමේ ණය ප්‍රතිපත්තිය අනුව ණය කාලසීමාව තුලදී ලැබියයුතු ශේෂයන් අයකරගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතු බවට නිර්දේශ කෙරේ. එසේම සමාගමේ කාරක ප්‍රාග්ධනයට බලපෑමක් නොවෙමින් දිගු හිඟ ශේෂයන් අයකරගැනීමට නව උපාය මාර්ග හඳුන්වා දිය යුතු බව නිර්දේශ කෙරේ.

## 1.6.2 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

(අ) 2022 දෙසැම්බර් 31 දිනට පහත දැක්වෙන දිගු හිඟ ගෙවිය යුතු ශේෂයන් නිරීක්ෂණය වූ අතර සමාගම විසින් දිගු හිඟ ශේෂයන් ඉවත් කිරීමට සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

| **විස්තරය** | **වටිනාකම (රු.)** |
|---|---:|
| බැංකුව විසින් හඳුනා නොගත් බැර | 2,636,395 |
| භාවිතා නොකළ ගුවන් ටිකට්පත් ආපසු ගෙවීම් | 35,700 |
| කාර්යමණ්ඩලයෙන් ආපසු ගෙවිය යුතු තැන්පතු | 25,000 |
| අවිනිශ්චිත ADM | 818,673 |
| **එකතුව** | **3,515,768** |

**කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම**

**බැංකුව විසින් හඳුනා නොගත් බැර**

කෝවිඩ් 19 න් පසු බොහොමයක් මගීන් සමාගමේ බැංකු ගිණුමට සෘජුව අරමුදල් මාරුකිරීම භාවිතා කරයි.

මගීන් හෝ විකුනුම් කාර්ය මණ්ඩලය ගෙවීම් තහවුරුව සමග අදාල ගණුදෙනුව තහවුරු කරන තුරු කිසිදු ගණුදෙනුවක් පියවීම නොකළ යුතු බවට මුදල් අයකැමිට උපදෙස් දෙනු ලැබේ.මගීන් තහවුරු කරන තුරු කාල පරතරයක් ඇත.

ඔවුන්ට උපදෙස් ලබා දී තිබුණද සමහර අවස්ථාවලදී ප්‍රායෝගික ගැටළු හේතුවෙන් පාලනය කළ නොහැක. වර්ෂ 5 කට පසුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව ශේෂය සමාගමේ ආදායම් ගිණුමට මාරු කෙරේ.

**භාවිතා නොකළ ගුවන් ටිකට්පත් ආපසු ගෙවීම්**

මෙම මුදල ආපසු ගෙවීමක් ලෙස ගුවන් සමාගමක් වෙතින් අප වෙත ලැබුණු අතර මගීන්ගෙන් හෝ කාර්ය මණ්ඩලයෙන් මේ දක්වා ඉල්ලීමක් ලැබී නොමැත.

වර්ෂ 5 කට පසුව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව ශේෂය සමාගමේ ආදායම් ගිණුමට මාරු කෙරේ.

**කාර්ය මණ්ඩලයෙන් ආපසු ගෙවිය යුතු තැන්පතු**

ආපසු ගෙවිය යුතු තැන්පතුවක් ලෙස සමාගමේ මුදල් අයකැමි විසින් රු.25,000 ක් ගෙවා තිබුණි.(ආරක්ෂක අරමුණක් සඳහා) ඇය සමාගමෙන් විශ්‍රාම ගිය පසු එය ඇයට ගෙවනු ලැබේ.

**අවිනිශ්චිත ADM**

සමහර විට ගුවන් සමාගම් ගාස්තු රීතියට අනුව අය නොකරයි.එම නිසා අදාල ගුවන් ටිකට්පත් සඳහා ඔවුන් අඩුමිලක් අය කරයි. එවැනි සිදුවීමකදී නැවත ගෙවීමට අය කළහොත් සමාගම වෙනස යම් කාලසීමාවක් තබාගනී. බොහෝ වීට වසරක් තුල කිසිදු ADM අප වෙත ලැබී නොමැති අතර මෙම මුදල සාමාන්‍යාධිකාරි/

**නිර්දේශය**

දිගු හිඟ ශේෂයන් ඉවත් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බව නිර්දේශ කෙරේ.

| | | | |
|---|---|---|---|
| | | ප්‍රධාන විධායක නිලධාරි අනුමැතිය ඇතිව AT මිලදීගැනීමේ ගිණුමට මාරු කෙරේ. | |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වෙළඳ ශේෂය රු. 51,376,877 ක් වන අතර එහි දින 0 සිට දින 360 ට වඩා වැඩි දිගු හිඟ ශේෂයන් ඇතුලත් වේ. සමාගම විසින් දිගු හිඟ ශේෂයන් ඉවත් කිරීමට සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. සමාගමේ ගෙවිය යුතු වෙළඳ ශේෂය පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දක්වා ඇත. | ගෙවීම සඳහා ඉන්වොයිස්පත් අප වෙත එවන ලෙස ඔවුන්ගෙන් ඉල්ලා සිටියද මේ දක්වා සමහර ගෙවිය යුතු වෙළඳ ශේෂයන් ගෙවීමට ඉල්ලීම් සිදුකර නොමැත.<br>එවැනි සිදුවීමකදී සමාගමේ පරිචය අනුව මෙම ගෙවිය යුතු ශේෂ වසර 5 ක් තබාගෙන පසුව නිසි සත්‍යාපනයක් සිදුකර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඇතිව ආදායමට මාරු කරනු ලැබේ. | දිගු හිඟ ශේෂයන් ඉවත් කිරීමට නිර්දේශ කෙරේ. |

| **දින ගණන** | **මුදල (රු.)** |
|---|---|
| 0-90 | 50,024,617 |
| 91-180 | 712,727 |
| 181-270 | 86,634 |
| 271-360 | 19,989 |
| > 360 | 532,910 |
| **එකතුව** | **51,376,877** |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් මිලියන 48.6 ක ලාභයක් වූ අතර ඊට අනුරූපව පෙර වර්ෂයේ අලාභය රුපියල් මිලියන 39.7 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රුපියල් මිලියන 88.3 ක වැඩිදියුණුවීමක් නිරීක්ෂණය විය.දඹදිව චාරිකා,පිටත සංචාර සහ හෝටල් නවාතැන්, සාමාන්‍ය ටිකට්පත් වැඩිවීම හේතුවෙන් ආදායම සියයට 242.58 කින් වැඩිවීම, වෙනත් ආදායම් සියයට 262.26 කින් වැඩිවීම සහ බෙදාහැරීමේ වියදම් සියයට 74.06 කින් අඩුවීම මෙම වැඩිදියුණුවීමට හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවනතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල විශ්ලේෂණය පෙර වසරට සාපේක්ෂව වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමගින් පහත දක්වා ඇත.

| විස්තරය | විචලතාවයේ වටිනාකම වැඩිවීම/(අඩුවීම) (රු.000') | විචලතාවය % | විචලනය සඳහා හේතුව |
|---|---|---|---|
| ආදායම් | 97,386 | 242.58 | සමාලෝචිත වර්ෂය තුල පිටත සංචාර සහ පිටත හෝටල් නවාතැන් හා ටිකට්පත් ආදායමේ වැඩිවීම මෙම විචලනයට ප්‍රධාන හේතුව විය.එසේම 2021 වර්ෂයේ ශූන්‍යව තිබූ දඹදිව චාරිකා ආදායම වැඩි වී තිබුණි. |
| වෙනත් ආදායම් | 13,158 | 262.26 | මෙයට ප්‍රධාන හේතුව වීසා සේවාවේ සහ විවිධ ආදායමේ වැඩිවීමයි. |
| ශුද්ධ මූල්‍ය ආදායම් | 10,480 | 308.32 | බැංකු තැන්පතු සඳහා ඉහළ පොළී ආදායමක් ලැබීම |
| වෙළඳ ලැබීම් වලට අදාල හානිකරණ ප්‍රතිපාදන ආපසු හැරවීම | 12,951 | 100.0 | දැනටමත් ප්‍රතිපාදන වෙන් කර තිබූ ණයගැතියන්ගෙන් මුදල් ලැබීම |

## 2.3 අනුපාත විශ්ලේෂණය

විගණනය සඳහා ලබා දී ඇති මූල්‍ය ප්‍රකාශන සහ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සහ ඊට පෙර වසර 04 ක කාලසීමාව සඳහා සමාගමේ ඇතැම් වැදගත් අනුපාත පහත දැක්වේ.

| අනුපාතය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | **2022** | **2021** | **2020** | **2019** | **2018** |
| **ද්‍රවශීලතා අනුපාත** | | | | | |
| ජංගම අනුපාතය | 3.0 | 2.5 | 4.5 | 3.5 | 4.0 |
| මුළු වත්කම් මත ශුද්ධ ජංගම වත්කම් | 0.62 | 0.54 | 0.61 | 0.6 | 0.67 |
| **ක්‍රියාකාරී අනුපාත** | | | | | |
| ණයගැති පිරිවැටුම් අනුපාතය | 19 | 7 | 4 | 13 | 14 |
| ණයගැති පිරිවැටුම් කාලය (දින) | 19 | 52 | 84 | 28 | 27 |
| **ලාභදායිත්ව අනුපාත** | | | | | |
| ශුද්ධ ලාභ අනුපාතය (සියයට) | 1.85 | (5.96) | (18.8) | 1.57 | 1.77 |
| **කාර්යසාධන අනුපාත** | | | | | |
| ස්කන්ධය මත ප්‍රතිලාභය (සියයට) | 25.53 | (24.90) | (31.13) | 11.48 | 12.17 |
| මුළු වත්කම් මත ප්‍රතිලාභය (සියයට) | 15.18 | (13.68) | (19.99) | 7.37 | 8.92 |

(අ) පෙර වර්ෂය හා සැසඳීමේදී ද්‍රවශීලතා අනුපාත සුළු වශයෙන් වැඩිවී තිබුණි.

(ආ) පෙර වර්ෂ හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුල ණයගැති පිරිවැටුම් අනුපාතය හා ණයගැති පිරිවැටුම් කාලය වැඩිදියුණු වී තිබුණි.

(ඇ) රටේ පැවති වසංගත තත්වය සහ ආර්ථික අර්බුධය අවසන්වීමෙන් පසු සංචාරක කර්මාන්තය ක්‍රමයෙන් වැඩිදියුණුවීම නිසා ස්කන්ධය මත ප්‍රතිලාභ (ROE) හා මුළු වත්කම් මත ප්‍රතිලාභ (ROA) අනුපාතයන් පෙර වර්ෂ 04 ට වඩා වැඩි ධනාත්මක සංඛ්‍යාවන් පෙන්නුම් කරයි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදන කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2 වගන්තිය අනුව , ආයතනයක් විසින් අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතු අතර ප්‍රසම්පාදන අයිතම සඳහා වඩා සුදුසු වෙළඳපල අගයක් ලබාගනිමින් ප්‍රසම්පාදන කාර්යය නියමිත වේලාවට අවසන් කිරීම සහතික කෙරේ.කෙසේ වෙතත් 2022 වර්ෂය සඳහා සමාගම විසින් එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ආයතනයේ ප්‍රමාණය අනුව සමාගමේ ප්‍රසම්පාදන අවශ්‍යතාවයන් ඉතා අවම වේ. සමාගමට වාර්ෂිකව විශාල පරිමාණයේ ප්‍රසම්පාදන අයිතම නොමැත.සෑම වර්ෂයක් ආරම්භයේදීම ලිපිද්‍රව්‍ය, ටෝනර් සහ Cartridges වැනි අයිතම සඳහා මිල ගණන් සමග මිල කියුම් කැඳවන අතර භාණ්ඩයේ මිල හා ගුණාත්මක බව මත සැපයුම්කරුවා තෝරා ගනී. අවශ්‍ය අයිතම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුව මිල කියුම් 03 ක් කැඳවා අනුමැතිය සඳහා ප්‍රසම්පාදන කමිටුවට ඉදිරිපත් කළ යුතුය.එය ලේකම් විසින් හෝ ප්‍රසම්පාදන රැස්වීම ලේඛණගත කිරීමට භාරදී ඇති කාර්ය මණ්ඩලය විසින් ලේඛණගත කරයි.එසේම සමාගමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගන්නා ලදී. | ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඵලදායීව සිදුකිරීමට ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 2.11.3 වගන්තිය අනුව ප්‍රසම්පාදන කමිටු රැස්වීම්වල ක්‍රියාපටිපාටීන් නියමිත ආකෘතියේ වාර්තා කළ යුතු අතර පැමිණ සිටි සාමාජිකයන් විසින් සහතික කළ යුතුය. කෙසේ වෙතත් දී ඇති උපදෙස්වලට යොමුවෙමින් සමාගමේ ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා නියමිත ක්‍රමයකට පිළියෙල කර නොතිබුණි. | අදහස් දක්වා නැත | ප්‍රසම්පාදන කමිටු රැස්වීම් වාර්තා නියමිත ක්‍රමයකට පිළියෙල කිරීමට නිර්දේශ කෙරේ. |

## 3.2 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මානව සම්පත් මෙහෙයුම්වල සුමට ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය අනුමත බඳවාගැනීමේ යෝජනා ක්‍රමයක් (SOR), අනුමත දීමනා සහ ගෙවීම් ව්‍යුහයක් සමාගමට නොතිබුණි. | වාරිකා හා සංචාරක සමාගම් විශේෂිත දෙපාර්තමේන්තුවල තනතුරු සඳහා ස්ථාවර කාර්යමණ්ඩල කෝටාවක් පවත්වා නොගනී.බොහොමයක් වාරිකා හා සංචාරක සමාගම් එම සමාගමට ලැබෙන ව්‍යාපාර ධාරිතාවය මත කාර්යමණ්ඩලය බඳවා ගනී. බොහෝවිට වාරිකා සමාගම් කාර්යමණ්ඩල ඉල්ලා අස්වීමේදී පවතින කාර්යමණ්ඩලය තුලින් අතැති ව්‍යාපාර කටයුතු කළමනාකරණය කරගත හැකිනම් වහාම එය සම්පූර්ණ නොකරයි.<br>ව්‍යාපාර ව්‍යාප්තියක් ඇති වාරිකා හා සංචාරක සමාගම් විසින් අදාල ව්‍යාපාර පුළුල් කිරීමට අවශ්‍ය කාර්යමණ්ඩලය බඳවා ගනී. වාරිකා හා සංචාරක කර්මාන්තය තුල සමාගමට එක් එක් විශේෂිත තනතුරු සඳහා ස්ථාවර කෝටාවක් නොමැත.<br>සමාගමේ ආයතනික සැලැස්ම තුල බඳවාගැනීමේ ක්‍රියාවලියක් ඇති අතර එය වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමත කොට ඇත. ඔබගේ පහසුව සඳහා එම ක්‍රියාවලියේ පිටපතක් අමුණා ඇත.(ඇමුණුම 1 පිටු අංක 23)<br><br>කර්මාන්ත ප්‍රමිතීන්ට අනුකුල වීම සඳහා අනුමැතීන්/නිර්දේශ මත සියළු කාර්යමණ්ඩල වැටුප් සහ ගෙවනු ලබන දීමනා වාර්ෂිකව සංශෝධනය කරනු ලබන අතර එය වාර්ෂිකව සෑම වර්ෂයක් ආරම්භයේදී අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබයි. ව්‍යුහාත්මක මාර්ගෝපදේශ යෝජනා ක්‍රමයේ සංශෝධනයන් අවශ්‍ය වූ විට කාර්ය මණ්ඩල වැටුප් සඳහා ව්‍යුහාත්මක මාර්ගෝපදේශ යෝජනා ක්‍රමයක්ද අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. (ඇමුණුම 11) | සමාගමේ මානව සම්පත් සුමට තත්වයෙන් පවත්වා ගැනීමට අනුමත යෝජනා ක්‍රම පිළිපදිමින් සමාගම සඳහා බඳවාගැනීමේ යෝජනා ක්‍රමයක් (SOR) හා වැටුප් ව්‍යුහයක් පිළියෙල කිරීම නිර්දේශ කෙරේ. |